## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

### ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

### ආර්ථික විද්‍යාව (05)

කාලය පැය 03 යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.**

---

01 I සුදුසු ප්‍රස්ථාර හා උදාහරණ යොදා ගනිමින් ඉහළ යන ආවස්ථික පිරිවැය (Increasing opportunity cost) හා හීනවන ආවස්ථික පිරිවැය (Decreasing opportunity cost) අතර වෙනස සාකච්ඡා කරන්න.

II ඉහළ යන පරිමානානුකූල ඵල (Increasing return to scale) හා හීනවන පරිමානානුකූල ඵල (Decreasing return to scale) අතර වෙනස සාකච්ඡා කරන්න.

02 I වෙළඳපොල පාරිභෝගික අතිරික්තය (Consumer Surplus) හා නිෂ්පාදක අතිරික්තය (Producer Surplus) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

II යම්කිසි වෙළඳපොලක පාරිභෝගික අතිරික්තයේ ප්‍රමාණය තීරණය කරන සාධක පැහැදිලි කරන්න.

III වෙළඳපොළ අහිමි සමාජ ප්‍රතිලාභ (Deadweight loss) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

IV අහිමි සමාජ ප්‍රතිලාභ (Deadweight loss) හා ඉල්ලුම් මිල නම්‍යතා වර්ග (Types of price elasticity of demand) අතර සම්බන්ධතාවය සුදුසු ප්‍රස්ථාර යොදාගනිමින් පැහැදිලි කරන්න.

03 I ආයතනයක නිෂ්පාදන ක්‍රියාවලියක තාක්ෂණ කාර්යක්ෂමභාවය (Technical efficiency ) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

II ආයතනයක නිෂ්පාදන ක්‍රියාවලියක තාක්ෂණ කාර්යක්ෂමභාවය (Technical efficiency) හා ආර්ථික කාර්යක්ෂමභාවයෙන් (Economic efficiency) වෙනස් වන්නේ කෙසේද?

III පහත සඳහන් අංශ යටතේ පූර්ණ තරඟකාරී වෙළඳපොල හා ඒකාධිකාරී වෙළඳපොල සංසන්දනාත්මකව සුදුසු ප්‍රස්ථාර සහිතව සාකච්ඡා කරන්න.

i ලාභ උපරිම කරන මිළ තීරණය කිරීම.
ii දීගුකාලීන ලාභ.
iii ආර්ථික කාර්යක්ෂමතාවය.

04 I රටක සේවා වියුක්තිය (Unemployment) ඇති කරන ප්‍රධාන හේතු මොනවාද?

II ව්‍යුහගත සේවා වියුක්තිය (Structured unemployment) හා ස්වාභාවික සේවා වියුක්තිය (Natural unemployment) යනුවෙන් අදහස් කරන්නේ මොනවාද?

III ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ ස්වභාවය හා ප්‍රධාන ප්‍රවනතා පැහැදිලි කරන්න.

05 I භාණ්ඩයක සැපයුම තීරණය කරන සාධක මොනවාද?

II ඒකීය මිළ න්‍යාය (Law of one price) යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

III භාණ්ඩයක ඉල්ලුම් නම්‍යතාවය තීරණය වීමට බලපාන සාධක සාකච්ඡා කරන්න.

IV සුදුසු උදාහරණ හා ප්‍රස්ථාර යොදා ගනිමින් වෙළඳපොල අවම මිළ හා උපරිම මිළ අතර වෙනස සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.

06 I සාධක වියදම (Factor Cost) හා වෙළඳපොල මිළ (Market Price) අනුව දළ දේශිය නිෂ්පාදිතය හා දළ ජාතික නිෂ්පාදිතය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

II ඉහත අගයන් ගණනය කරනු ලබන්නේ කෙසේද?

III වෙළඳපොල මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයෙන් වැය කළ හැකි ආදායම (Disposable Income) වෙනස් වන ප්‍රධාන අංග මොනවාද?

IV ආර්ථිකයක මූලික විදීම් (Injection) සහ කාන්දු වීම් (Leakage) සාකච්ඡා කරන්න. ඔබේ අදහස පැහැදිලි කිරීම සඳහා ජාතික ආදායම් චක්‍රීය ප්‍රවාහය භාවිතා කරන්න.

V පහත සඳහන් සංකල්ප භාවිතා කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ මූලික තොරතුරු සපයන්න.

i ආර්ථික ව්‍යුහය
ii ඒක පුද්ගල ආදායම
iii උද්ධමන අනුපාතය
iv ආර්ථික වර්ධන අනුපාතය
v සේවා ව්‍යුක්ති අනුපාතය

07 සුදුසු උදාහරණ දෙමින් කෙටි සටහන් ලියන්න.

I රජයේ අයවැය හිඟය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති (Fiscal policies)

II ගෙවුම් ශේෂය හා මුදල් අවප්‍රමාණය

III දුඛිත දර්ශකය (Misery index) හා සතුටු දර්ශකය (Happiness index)

IV බහුමානීය දිළිඳු කමේ දර්ශකය (Multidimensional poverty index)

***************